www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2008 හි වියවුල සහ 2009 සඳහා අනාගත ශක්‍යතාවෝ

## The crash of 2008 and the prospects for 2009

**නික් බීම්ස් විසිනි**
**2009 ජනවාරි 2**

ඓතිහාසික විමර්ශනයක් සිදු කෙරෙන කවර කලෙක වුවද එකී විමසුම තුලදී යම් නිශ්චිත වර්ෂයන් තමා වෙත අවධානය දිනා ගනී. එසේ වන්නේ එම වර්ෂයන් තීරණාත්මක සිද්ධීන් වලට සම්බන්ධිත බැවිනි.ඒ අර්ථයෙන් ගත්කල, 1914, 1929, 1933, 1939,සහ මෑත වකවානුවේ 1959 සහ 1989 ක්ෂනිකව මතකයට නැගෙන වර්ෂයෝ වෙත්. 2008 නිමා වූයේ එම කාණ්ඩයට එක් වන අයුරිනි.

සංඛ්‍යාවෝ තමා වෙනුවෙන්ම කතා කරත්. එක්සත් ජනපද ආණ්ඩුව මත් ඩොලර් ට්‍රිලියන 8කට වැඩි මුදලක් සපයමින් තම මූල්‍ය පද්ධතිය යලි පන ගන්වා ගැනීමට කැප විය. ලොව වටා මධ්‍යම බැංකු තම පොලී අනුපාතිකයන් වාර්තාගත පහලම අගයන්ට කපා දැමූ අතර එක්සත් ජනපදය තම රට තුළ මූල්‍යමය විලයනයක් (financial melt down) වලක්වා ගැනීමට දැරූ වියරු ප්‍රයත්නයේදී පොලී අනුපාතය ශූන්‍ය ආසන්නයටම පහත හෙලීය.

වර්ෂය නිමා වූයේ ලොව වටා කොටස් වෙළඳපොල පාඩු අත් විඳින බැව් පෙන්නුම් කරමිනි. එවැන්නක් සිදුවූයේ මහා අවපාතයේ නරකම වර්ෂයන්ට පසු පළමු වරටයි. එක්සත් ජනපදය තුල එස් සහ පී 500 (S&P 500) දර්ශකය සියයට 38.5 කින් පහතට ඇද වැටුණු අතර මින් සුවිසල් අගයක් පහත වැටුනේ අවසන් මාස කීපය තුලයි. සියයට 47.1 කින් කොටස් වෙළඳපොල ඇදවැටුණු 1931 න් පසු එක්සත් ජනපද කොටස් වෙළඳපොල නරකම මට්ටම් වලින් පහතට ඇදවැටුණු වර්ෂය ලෙස 2008 වාර්තාගත වෙයි.

ජපානය තුල පසුගිය වර්ෂය නිමා වූයේ නිකී දර්ශකය සියයට 42.1කින් පහත හෙලමිනි. කොටස් සහ ඉඩම් බුබුල බිඳවැටුණු 1990 වසරේ වාර්තාගතවූ ජපානයේ විශාලතම කොටස් වෙළඳපොල බිඳවැටුම පවා සියයට 38.7ක් විය. කොරියාව පසුගිය වසර නිම කලේ තම කොස්පි දර්ශකය සියයට 40.7 ක පාඩුවකට යටත් කරමිනි.යුරෝපය හරහා මීට සමාන ඇදවැටීම් වාර්තා වෙද්දී ආසියාවෙන් වාර්තාවෙන මෙම ප්‍රතිපලයන් දෙකම, කොටස් වෙළඳපොල වාර්තා තැබීම ඇරඹූ දින සිට නරකම අගයන් වාර්තා කරයි.

මූල්‍ය වෙළඳපොල තුල ඇතිවූ බිඳවැටුම දැන් යථා ආර්ථිකය තුල පිළිබඹු වෙමින් පවතී.ලබන වසර තුල දියුණු ධනපති ආර්ථිකයන්ගේ සමස්ත ආර්ථික නිශ්පාදනය පහත වැටෙනු ඇත. දෙවන මහා ලෝක සංග්‍රාමයෙන් පසු එවන් හැකිලීමක් සිදුවුණ ප්‍රථම අවස්ථාව මෙය වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ බ්ලැන්ඩාර්ඩ් ට අනුව මෙම හැකිලීම 1930 ගණන්වල මහා අවපාතයෙන් පසු දකුනට ලැබෙන සියලු හැකිලීම් ඉක්මවා යා හැක.

නොවැම්බරයේදි, ලොව දෙවන විශාලතම ආර්ථිකය වන ජපානය තම කාර්මික නිශ්පාදනයේ එක් මසක පමණක් පහත වැටීම සියයට 8 ක් ලෙස වාර්තා කල අතර එය ජපාන ඉතිහාසයේ එක් මසක විශාලතම බිඳවැටුමයි.ලෝකයේ ප්‍රධානතම කාර්මික ආර්ථිකයක් වන කොරියාව තුල නොවැම්බරයේ කාර්මික නිශ්පාදනය ඉහත වසර හා සසඳන කල සියයට 14.1කින් ඇදවැටුණු අතර එය එරටින් වාර්තා වූ විශාලතම පහත වැටීමයි.

ලෙවී වාර්තාවට අනුව එක්සත් ජනපද දල ජාතික නිශ්පාදනය සියයට 12 කින් පමණ පහත වැටෙණ අතර විරැකියාව සියයට 10 න් ඉහල නගිනු ඇත.වාර්තාව නිමා වන්නේ පුද්ගලික වියදම් කිරීමේ තත්ත්වය බිඳ වැටීම හේතුවෙන් වසර දෙකක් තුල විරැකියාව සහ නිශ්පාදනය දරාගත හැකි මට්ටමට නැවත ගෙන ඔම සඳහා රාජ්‍ය ආදායම් සහ මූල්‍ය යොදා ගැනීමට එක්සත් ජනපද අධිකාරයන් අසමත් වනු ඇත යනුවෙනි.

දැවැන්ත මූල්‍යමය පාඩු මගින් සහ මූල්‍ය බිඳවැටීමේ වේගය හා ප්‍රමාණය මගින් 2008 වර්ෂය ඓතිහාසික වශයෙන් වැදගත් වර්ෂයක් ලෙසට ස්ථාපනය කොට ඇත. නමුදු මෙම වසරේ ආර්ථික සිද්ධීන්ගේ වැදගත්කම හුදෙක් ප්‍රමාණාත්මක ප්‍රශ්නයක් නොවේ.

2007 වසර මධ්‍යයේ අවමුඛ උකස් අර්බුදය මතුවීමත් සමග ඇරඹී, වසර එකහමාරක් තුල ක්‍රියාත්මක වූ සිද්ධීන් මගින් පසුගිය දශක තුන පුරා ක්‍රියාත්මක වූ ධනේහ්වර සමුච්චයන්ගේ රූපාකාරය බිඳ වැටෙමින් පවත්නා බව සනිටුහන් කෙරින.මෙම රූපාකාරය පැන නැගුනේ 1970 දශකයේ ධනේශ්වර ආර්ථිකයේ ඇතිවූ ඓතිහාසික අර්බුදයෙනි.

දැනට කැබලි වෙමින් පවත්නා දැවැන්ත ණය සහ මූල්‍ය අට්ටාලය, අස්වාභාවික වර්ධනයක ප්‍රතිඵලයක් යැයිද, එසේ නොවුණේ නම් ධනේශ්වර පද්ධතිය සුමටව ඉදිරියට ප්‍රගමනය වන්නේ යැයිද සැළකීම මිත්‍යාවකි. ඒ වෙනුවට ප්‍රාග්ධන සමුච්චයේ ගෝලීය යාන්ත්‍රණයේ ප්‍රධාන සංරචකය මෙමෙ ණය සහ මූල්‍ය අට්ටාලයයි.

මුදල් උපමාරු මගින් මුදල් ඉපයීම සඳහා පෙර කවර කලෙකවත් නොවූ තරම් වඩාත් සංකීර්ණ ක්‍රියාදාමයක් යොදා ගැනුනු අතර ඊනියා මූල්‍යමය නව සොයා ගැනීමේ ක්‍රියාදාමය ධනේශ්වර ආර්ථිකයේ අතිමූලික නියාමයන් අභිභවනය කිරීමට සමත් වනු ඇතියි යන අදහස සැළකිය යුතු තරම් කාලයක් පැවතුණි. කෙසේ නමුදු කවර ප්‍රමාණයේ මූල්‍යමය උපමාරුවකට හෝ වෙනස් කළ නොහැකි කරුණ වන්නේ , නිශ්පාදන ක්‍රියාවලිය තුල කම්කරු පංතියෙන් සූරාගනු ලබන අතිරික්ත වටිනාකම මත ප්‍රාග්ධනය සමුච්ඡයවීම රඳා පවතින බවයි.

වත්මන් අර්බුදය පුපුරා යාම මගින් පෙන්නුම් කරනු ලබන්නේ පසුගිය දශක තුනේ සිදු කරන ලද මූල්‍යකරණය , පවත්නා අතිරික්ත වටිනාකම් ස්කන්ධයෙන් දැවැන්ත කොටසක් මූල්‍යය මගින් පිටස්තර කොට තබන ලක්ෂ්‍යයකට පැමිණ ඇති බවයි. මෙහි ප්‍රතිඵලය ලෙස ක්‍රියාදාමයන් දෙකක් ගමන් ආරම්භ කොට ඇත. එක් අතකින් අතිරික්ත වටිනාකම් සමුච්චය කර ගැනීම සඳහා කම්කරු පංතිය මත පූර්ණ පරිමාණ ප්‍රහාරයක් දියත් කිරීමට ප්‍රාග්ධනයට බලකෙරී ඇති අතර අනෙක් අතට ප්‍රාග්ධනයේ සෑම කොටසකටම තම තරගකරුවන් බිත්තියට හේත්තු කිරීම සඳහා බල කෙරී ඇත. වෙනත් වචනවලින් කිවහොත් 1930 ගණන් ගුණාංගීකරණය කරන ලද සියලුම තත්ත්වයන්, එනම් දැවැන්ත විරුකියාව සහ කම්කරු පංතියේ සමාජමය තත්ත්වයට එල්ල කරන ලද ගැඹුරුතර ප්‍රහාරයන් ඒ සමගම ධනේශ්වර බලයන්ගේ විරුද්ධ කණ්ඩායම්  අතර තියුණුවන ගැටුම් ප්‍රතිනිර්මාණය වෙමින් පවතී.

මෙම බිඳ වැටීම ඉදිරියේ ධනේශ්වර පාලක පංතියේ දේශපාලනමය සහ දෘශ්ටිවාදාත්මක නියෝජිතයන් මෙම අර්බුදයට යම් ආකාරයක විසඳුමක් ඔවුන් සතුව ඇති බවට මිත්‍යාවක් වැපිරීමට වියරු සහගත උත්සාහයක නිරතව සිටී.

ඊනියා කාර්යක්ෂම වෙළඳපොල කල්පිතයන් එනම් වෙළඳපොල මිල ගණන් සැමවිටම නිරවද්‍යය යන අදහස දශක තුනක් පුරා අධිකාරිත්වය දැරීමෙන් අනතුරුව නව මිත්‍යාවක් නිපදවමින් සිටීත එනම් කේන්සියානු ආර්ථික පියවරයන් වන රාජ්‍ය මුදල් වැඩියෙන් වැයකිරීම සහ නය පරතරයන් පියවීම මත පාදක වී ධනේශ්වර ආර්ථිකයේ සෞඛ්‍යය  නැවත යථා තත්ත්වයට පත්කිරීම හැකැයි යන ප්‍රලාපයයි.

ඓතිහාසික වාර්තාව විසින් සනාත කෙරෙනුයේ මෙහි අනෙක් පැත්තයි. 1930දී රූස්වෙල්ට් විසින් නව ආර්ථික පිලිවෙත ( NEW DEAL) මගින් ක්‍රියාවට දැමුනු පියවරයන් මගින් ඇමරිකානු ආර්ථිකය යථා තත්වයට පත් නොවිනි. දශකයේ මධ්‍යම වසරවලදී ඇතිවූ කෙටි ඉහල යාමකට අනතුරුව ඇමරිකානු ආර්ථිකය 1937-38 කාලය තුලදී ප්‍රධාන පසුබැසීමක් අත් විදින ලදි. මෙම බැස්මට සමාන බැස්මක් අන් කවර කලකදී හෝ අත්විද නොතිබිනි. වත්මන් ආර්තිකයේ නැවත හැඩ ගස්වා ගැනීම ඇරඹුනේ යුධ විනාශය සදහා කරන ලද හැරී ගැනීමත් සමග වන අතර ගෝලීය ස්තාවරත්වය ප්‍රතිසංවිධානය කෙරුනේ දෙවන මහා ලෝක සංග්‍රාමයේදී සිදු කරන ලද දැවන්ත විනාශයෙන් පසු ලෝක ආර්තිකය යලි ගොඩ නැගීමෙන් පමනකි.

1930 ගනන්වල පටන් වර්ධනය වූ ගැඹුරුතම අවපාතය වැලක්වීම සදහා 1970 ගනන්වල මුල් කාලයේ දී ගනු ලැබූ කේන්සියානු  පියවරවල් අසමත් විය. ඔවුහු ඉහල විරැකියාව සමග බැදීගත් ඉහල උද්ධමනය පවත්වා ගෙන යාමේ වැඩ පිලිවෙල ප්‍රවර්ධනය කරන ලද අතර එමගින් රේගන් සහ තැචර් විසින් පෙරමුන ගන්නා ලද 'නිදහස් වෙලද පොල' වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සදහා අවශ්‍ය දේශපාලන කොන්දේසි නිර්මානය කිරීමට උදව් විය.

1990දී ජපානය තුල කොටස් වෙලද පොල හා ඉඩම් මිල බුබුල බිද වැටීමෙන් පසු  නොකඩවා ක්‍රියාත්මක කල යෝජනා ක්‍රම මගින් ආර්තිකය යලි පන ගන්වා ගත නොහැකි විය.

ධනේෂ්වර ආර්තිකය බිද වැටීම වලක්වා ගනුවස් කේන්සියානු පියවරයන් ආර්ථික විෂ නාශකයක් ලෙස ක්‍රියාත්මක නොවූ නමුදු එමගින් පාලක පංතිය සදහා වැදගත් දේශපාලනික වැඩ පිලිවෙලක් සම්පාදනය කර දුනි.  රූස්වේල්ට්ගේ නව පිලිවෙත (NEW DEAL) 1930 ගනන්වල අර්බුදය නිමා කිරීම සදහා කිසිවක් ඉටු නොකල නමුදු , කම්කරු පංතිය තුල සමාජවාදී ඉදිරි දර්ශනයක් වර්ධනය වීම වලක්වාලනු වස් ධනේශ්වර අර්බුදයට විසදුමක් සොයා ගත හැකිය යන මිත්‍යාව වගා දිගා කිරීමට එමගින් ඉමහත් සේවයක් ඉටු කෙරින.

1930 ගනන්වල බිද වැටීමෙන්  පසු මුහුන දුන් දරුනුතම අර්බුදයට ලෝක ධනවාදය ඇතුලු වෙද්දී සහ පාලක පංතීන් තමන්ගේ ම අත්දැකීම් මත පදනම් වෙද්දී කම්කරු පංතිය ඉතිහාසයේ පාඩම් උකහා ගත යුතුමය. දෙවන ලෝක යුද්ධයෙන් සහ න්‍යෂ්ටික අවි භාවිතයෙන් දස ලක්ෂ සංඛ්‍යාත මහජනතාවට මරු කැදවීමෙන් කුලු ගැන්වුන  මහා අවපාතයේ අත්දැකීම් පුනර්කරනය වීම වලක්වා ගැනීමට ඇති එකම මාවත වනුයේ ඓතිහාසිකව යල් පීනූ ලාභ පද්ධතිය පෙරලා දැමීමයි. 2008 වසර ලෝක ධනවාදය බිඳ විසිර ගිය වසරක් ලෙස සලකුනු වන අතර 2009 වසර ලෝක කම්කරු පංතිය ජාත්‍යන්තර සමාජවාදය සදහා කරන අරගලයේ යලි පැන නැගීමක ආරම්භක ලක්‍ෂය වනු ඇත.

© www.wsws.org